**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව**
**මහ සභා රැස්වීම.**
**2022.03.15**

**සහභාගි වූ සභික නාමාවලිය :-**

01. ගරු සභාපති.ඩබ්.සුරන්ත ජයලත් වීරසිංහ මහතා
02. ගරු උප සභාපති මාතරආරච්චිගේ ජයවීර මහතා
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුනිල් ශාන්ත මහතා
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. සුජිත් ප්‍රේමලාල් මහතා
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.කේ.බී.සමීර රුක්ෂාන් මහතා
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ කැළුම් වික්‍රමසිංහ මහතා
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.සරත් වික්‍රමසූරිය මහතා
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. දසුන් මධුරංග වාසනා වික්‍රමගේ මහතා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩබ්.එස්.එම්. අෂානි ප්‍රියංගිකා මහත්මිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රණී ඩී.එච්.සීතා පද්මණී මහත්මිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී රේණුකා ජීවානි අලහප්පෙරුම මහත්මිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ. සමන්ත රත්නායක මහතා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. අමිත් රණතුංග මහතා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස් චන්ද්‍රරත්න කුරුකුල මහතා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එම්.ඒ.ජී. අනෝමා රෝෂිණී නිලන්ති මෙනවිය
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩබ්.එම්. ධම්මිකා නිලන්ති බණ්ඩාර මිය
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. මල්ක මදුභාෂන මහතා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එල්.ජී.රංජිත් මහතා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එන්. ඒ. සාගරිකා පුෂ්ප කුමාරි මහත්මිය
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. සුසන්ත කුමාරසිරි මහතා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී. ඥානතිලක මහතා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. චන්ද්‍රසිරි මහතා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.පී. පැතුම් මධුසංක මහතා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එල්.ඒ.කාන්තිලතා මහත්මිය
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. ජී. බ්‍රෙසිල් නුවන් කුමාර මහතා

**සහභාගි නොවූ සභික නාමාවලිය :-**

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් මේනුක දිසානායක මහතා

**සහභාගි වූ නිලධාරින් :-**

01.ලේකම් (වැ.බ) - එච්.එල්.ප්‍රේමදාස මයා.

02.සංවර්ධන නිලධාරී - ඩී.කේ.නිසංසලා මිය.

**ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022.03.15 දින පැවති මහ සභා රැස්වීමේ සංෂිප්ත වාර්තාවයි.**

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 මාර්තු මස මහ සභා රැස්වීම ආරම්භ කිරීම සඳහා 2022.03.15 වන දින පෙ.ව.10.00ට ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා අසුන් ගන්නා ලදි. ආගමික වතාවත් සිදු කිරීමෙන් හා ජාතික ගීය ගායනා කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පිළිගැනීමේ කථාව පවත්වන ලදී. ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමාත් ගරු සභික මණ්ඩලයත්,ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයත්,පිළිගැනීමෙන් අනතුරුව, න්‍යායපත්‍රානුකූලව සභාවේ කටයුතු ආරම්භ කරන ලදි.

**01.පසුගිය මහ සභා වාරයේ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

- 2022.02.17 වන දින පැවති මහ සභා වාරයේ සභා වාර්තාව සභා සම්මත කිරීම.

ගරු සභාපති සුරන්ත වීරසිංහ මහතා

ගරු මන්ත්‍රීතුමනි, 2022.02.17 වෙනි දින පැවති මහ සභා වාරයේ සභා වාර්තාව සභා සම්මත කිරීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා

මෙම සභා වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කර සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා

එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 පෙබරවාරි මස 17 වැනි දින පැවති මහ සභා වාරයේ සභා වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත විය.**

**සංශෝධන අංක 01**

**යථා පරිදි කල් දී ඇති යෝජනා අංක 05.15 ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ සේවය සඳහා නව සෞඛ්‍ය කම්කරුවන් තිදෙනෙකු අනියම් පදනම මත බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාවේ, හා තීරණයේ ගරුසිංගේ නිලාන් ප්‍රදීප් කුමාර (950391090v) යන නම පිටවෙල මනන්නලාගේ ජයලත් විජේසිරි (852610277v) යනුවෙන් සංශෝධනය කරන ලදි.**

**02. ගරු සභාපතිතුමාගේ නිවේදන.**

- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් මේනුක මහතා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

ගරු සභාපති සුරන්ත ජයලත් මහතා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් මේනුක මහතා අසනීප තත්ත්වයේ පසුවන බැවින් අද දින මහ සභා රැස්වීම සඳහා සහභාගිවීමට නොහැකි බව දන්වමින් ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා.ඔහුගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට මා යෝජනා කර සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**03. සංදේශ/පෙත්සම්/පැමිණිලි ඉදිරිපත් කිරිම.**

**නැත.**

**04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ.**

**නැත.**

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**05.01) ව්‍යාපාර බද්ද,කර්මාන්ත බද්ද හා බලපත්‍ර ගාස්තු ගෙවීමට ව්‍යාපාරිකයින් දැනුවත් කිරීම වෙනුවෙන් 6'x3' ප්‍රමාණයේ බැනර් 06ක් සකස් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

ව්‍යාපාර බද්ද,කර්මාන්ත බද්ද හා බලපත්‍ර ගාස්තු ගෙවීමට ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිටින ව්‍යාපාරිකයින් දැනුවත් කිරීම වෙනුවෙන් බල ප්‍රදේශයේ විවිධ ස්ථානවල ප්‍රදර්ශණය කිරීමට 6'x3' ප්‍රමාණයේ බැනර් 06ක් සකස් කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ව්‍යාපාර බද්ද,කර්මාන්ත බද්ද හා බලපත්‍ර ගාස්තු ගෙවීමට ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිටින ව්‍යාපාරිකයින් දැනුවත් කිරීම වෙනුවෙන් 6'x3' ප්‍රමාණයේ බැනර් 06ක් සකස් කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.02) 2022 වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි මාසයන්හි ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු සතිපොල හා කඩ කාමරයන්හි වාරික මුදල් ගෙවීම ප්‍රමාදවීම මත අය කරනු ලබන දඩ පොලී ගාස්තු අය නොකිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

කොරෝනා වෛරස් ව්‍යාප්තිය හේතුවෙන් සතිපොල හා කඩ කාමර තවමත් යථා තත්ත්නවය පත් වී නැහැ.එම නිසා 2022 වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි මාසයන්හි ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු සතිපොල හා කඩ කාමරයන්හි වාරික මුදල් ගෙවීම ප්‍රමාදවීම මත අය කරනු ලබන දඩ පොලී ගාස්තු අය නොකිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජිත් ප්‍රේමලාල් මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, කොරෝනා වෛරස් ව්‍යාප්තිය හේතුවෙන්, 2022 වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි මාසයන්හි ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු සතිපොල හා කඩ කාමරයන්හි වාරික මුදල් ගෙවීම ප්‍රමාදවීම මත අය කරනු ලබන දඩ පොලී ගාස්තු අය නොකිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.03) 2022 පෙබරවාරි මස 1,000,000.00 ට වැඩි වියදම් සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>

2022 පෙබරවාරි මස මෙම සභාවේ ලක්ෂ 10ට වැඩි වියදම් 02ක් සිදු කරල තියෙනවා. එය විස්තර සහිතව පහතින් දක්වනවා. ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියලා මා යෝජනා කරනවා.

| අනු අංකය | දිනය | වවුචර් අංකය | චෙක්පත් අංකය | ආදායකයාගේ නම | ගෙවීම් විස්තරය | මුදල රු: |
|---|---|---|---|---|---|---|
| 01 | 2022.02.18 | 218 | 787743 | සී/ස මුල්ඇඩියාවල ගම නැගුම..... | මහයාය විහාරස්ථානය...... | 1,390,813.43 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 02 | 2022.02.24 | 87 | 787745 සිට 787760 දක්වා | වැටුප් | කාර්ය මණ්ඩල වැටුප් (ස්ථිර) | 3,772,611.66 |
| එකතුව | | | | | | **5,163,425.09** |

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සාගරිකා පුෂ්ප කුමාරි මිය</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2022 පෙබරවාරි මස රු:5,163,425.09ක් වූ ලක්ෂ 10ට වැඩි වියදම් සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.04) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු LL 7529 අංක දරණ කෘෂ කැබ් රථය සඳහා 120Amp බැටරියක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු LL 7529 අංක දරණ කෘෂ කැබ් රථය සඳහා 120Amp බැටරියක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියලා මා යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු LL 7529 අංක දරණ කෘෂ කැබ් රථය සඳහා 120Amp බැටරියක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.05) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු LL 6987 අංක දරණ ටිපර් රථය සඳහා 900x20 ප්‍රමාණයේ ටයර් 04ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු LL 6987 අංක දරණ ටිපර් රථය සඳහා 900x20 ප්‍රමාණයේ ටයර් 04ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුජිත් ප්‍රේමලාල් මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු LL 6987 අංක දරණ ටිපර් රථය සඳහා 900x20 ප්‍රමාණයේ ටයර් 04ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**05.06) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ගලි බවුසරය සඳහා 750x16 ප්‍රමාණයේ ටයර් 02ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ගලි බවුසරය සඳහා 750x16 ප්‍රමාණයේ ටයර් 02ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු ගලි බවුසරය සඳහා 750x16 ප්‍රමාණයේ ටයර් 02ක් මිලදී ගැනීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ හෙයින් ඒකමතිකව සහා සම්මත විය.**

**05.07) 2021 භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ මත දෝෂ සහිත පරිගණක අළුත්වැඩියා කිරීම සඳහාත්,ඒ සඳහා අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීම සඳහාත් අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
2021 භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ මත දෝෂ සහිත පරිගණක අළුත්වැඩියා කිරීම සඳහාත්,ඒ සඳහා අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, 2021 භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ මත දෝෂ සහිත පරිගණක අළුත්වැඩියා කිරීම සඳහාත්,ඒ සඳහා අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීම සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**05.08) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු PB 9856 අංක දරණ කැබ් රථය අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු PB 9856 අංක දරණ කැබ් රථයේ

- ෆැන් බෙල්ට් එක යෙදීම
- ෂොකැබ්ෂෝවර් 04ක් අළුතින් යෙදීම
- තිරිංග පද්ධතිය අළුත්වැඩියා කිරීම
- ඉදිරිපස රෝද ආශ්‍රිත අනෙකුත් අළුත්වැඩියා කටයුතු

සිදු කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියලා මා යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.චන්ද්‍රසිරි මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු PB 9856 අංක දරණ කැබ් රථයේ ඉහත සඳහන් අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සුනිල් ශාන්ත මහතා විසින් සභාගත කරන ලද යෝජනා.**</u>

**05.09) කුඹුගොඩආර,විදුලි බලාගාර පාර,පළමු වන පටුමග ඉතිරි කොටස තාර අතුරා සංවර්ධනය කිරීමට අදාල ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා ගැනිමට අදාළ යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සුනිල් ශාන්ත මහතා</u>
කුඹුගොඩආර,විදුලි බලාගාර පාර,පළමු වන පටුමග ඉතිරි කොටස තාර අතුරා සංවර්ධනය කිරීම වෙනුවෙන් සකස් කරන ලද රු: 1,142,000.00ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, කුඹුගොඩආර,විදුලි බලාගාර පාර,පළමු වන පටුමග ඉතිරි කොටස තාර අතුරා සංවර්ධනය කිරීම වෙනුවෙන් සකස් කරන ලද රු: 1,142,000.00ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා විසින් සභාගත කරන ලද යෝජනාව.</u>**

**05.10) ජයතිමාපියපුර පොදු සුසාන භූමිය නැවත මැණුම් කටයුතු සිදු කර ආරක්ෂිත වැට ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා</u>**

හිඟුර ග්‍රාම නිලධාරී වසමේ ජයතිමාපියපුර පොදු සුසාන භූමිය මහවැලි අධිකාරියෙන් මැණුම් කටයුතු කරලා නිල වශයෙන් සභාවට භාර දීල දැන් කාලයක් වෙනවා.හිඟුර ජනතාවත් කුට්ටිගල ජනතාවත් යන දෙගොල්ලම මේ සුසාන භූමිය භාවිත කරනවා.මේ සුසාන භූමිය විටින් විට අනවසර පදිංචිකරුවන්ගේ ග්‍රහණයට ලක් වෙනවා.එම නිසා මාගේ කොට්ඨාශයට අයත් ජයතිමාපියපුර පොදු සුසාන භූමිය නැවත මැණුම් කටයුතු සිදු කර ආරක්ෂිත වැට ඉදිකිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුජිත් ප්‍රේමලාල් මහතා</u>**

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ජයතිමාපියපුර පොදු සුසාන භූමිය නැවත මැණුම් කටයුතු සිදු කර ආරක්ෂිත වැට ඉදිකිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ හෙයින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.** හදිසි යෝජනා

**06.01)** **ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ගබඩා කාමරයක් සහ වැසිකිලි පද්ධතියක් ඉදි කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

**<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>**

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ගබඩා කාමරයක් සහ වැසිකිලි පද්ධතියක් ඉදි කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද රු:1,849,500.00ක ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.චන්ද්‍රසිරි මහතා</u>**

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ගබඩා කාමරයක් සහ වැසිකිලි පද්ධතියක් ඉදි කිරීම සඳහාත්,ඊට අදාලව සකස් කරන ලද රු:1,849,500.00ක ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**06.02) බලපත්‍ර ගාස්තු ලිපි තැපැල් කිරීම වෙනුවෙන් රු:30,000.00ක අත්තිකාරම් මුදලක් ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

**<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>**

බලපත්‍ර ගාස්තු ලිපි තැපැල් කිරීම වෙනුවෙන් රු:30,000.00ක අත්තිකාරම් මුදලක් ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රෙසිල් නුවන් කුමාර මහතා</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, බලපත්‍ර ගාස්තු ලිපි තැපැල් කිරීම වෙනුවෙන් රු:30,000.00ක අත්තිකාරම් මුදලක් ලබා ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරනු ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**06.03) ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු තෙරුන්නාන්සේගම ජල ව්‍යාපෘතියට පිවිසෙන මාර්ගය පස් අතුරා සංවර්ධනය කිරීම සඳහාත්, ඊට අදාලව සකස් කරන ලද ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා</u>
මෙම ප්‍රාදේශීය සභාව සතු තෙරුන්නාන්සේගම ජල ව්‍යාපෘතියට පිවිසෙන මාර්ගය පස් අතුරා සංවර්ධනය කිරීම සඳහාත්, ඊට අදාලව සකස් කරන ලද රු:334,700.00ක ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව සතු තෙරුන්නාන්සේගම ජල ව්‍යාපෘතියට පිවිසෙන මාර්ගය පස් අතුරා සංවර්ධනය කිරීම සඳහාත්, ඊට අදාලව සකස් කරන ලද රු:334,700.00ක ඇස්තමේන්තුව සඳහාත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී රේණුකා ජීවානි අලහප්පෙරුම මහත්මිය විසින් සභා ගත කරන ලද යෝජනාව.</u>

**06.04) ජූලංගැටේ ග්‍රාමසේවා වසමේ පිහිටි ජූලංගැටේ පොදු සුසාන භූමියේ කොටසක සේවා පියසක් ඉදි කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී රේණුකා ජීවානි අලහප්පෙරුම මහත්මිය</u>
ජූලංගැටේ ග්‍රාමසේවා වසමේ පිහිටි ජූලංගැටේ පොදු සුසාන භූමියේ කොටසක සේවා පියසක් ඉදි කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රේසිල් නුවන් කුමාර මහතා</u>
ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, ජූලංගැටේ ග්‍රාමසේවා වසමේ පිහිටි ජූලංගැටේ පොදු සුසාන භූමියේ කොටසක සේවා පියසක් ඉදි කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොවූ බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා විසින් සභාගත කරන ලද යෝජනාව.**</u>

**06.05) උඩවලව, මලබොටුආර ක්‍රීඩා පිටියෙහි පිහිටා ඇති දිරාපත් වූ ප්‍රජා ශාලා ගොඩනැගිල්ල නැවත ඉදිකර ගැනීම සඳහා ඇඹි/ප්‍රාලේ/සව/සං/223 ප්‍රජා මූලික වැඩිහිටි සංවිධානය වෙත අවසර ලබාදීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව.**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.එච්.සුනිල් මහතා**</u>
උඩවලව, මලබොටුආර ක්‍රීඩා පිටියෙහි පිහිටා ඇති දිරාපත් වූ ප්‍රජා ශාලා ගොඩනැගිල්ල නැවත ඉදිකර ගැනීම සඳහා ඇඹි/ප්‍රාලේ/සව/සං/223 ප්‍රජා මූලික වැඩිහිටි සංවිධානය වෙත අවසර ලබාදීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා**</u>

ගරු සභාපතිතුමණි, ඉතා හොඳ යෝජනාවක්.ඒ යෝජනාව මා ස්ථිර කරනවා.මේ ස්ථානය සභාව සතු අනෙක් ඉඩම් වගේම මැණුම් කටයුතු සිදු කළ යුතු ස්ථානයක්.2013 විතර ඔතන මැණුම් කටයුතු කළා.එතනදි අපිට අවාසියක් වෙලාද කියලා බලන්න ඕන.ඔතන අළුතින් ඉදි කිරීමක් කරනව නම් හොඳම සැලැස්මකට කරන්න ඕන.මොකද එතන තියෙන ඉඩකඩ සීමිත නිසා.රත්තරන් වටින භූමියක්.වලව හන්දියේ පොදු වැසිකිලියකට මුල් ගල් තියලා තිබුණා.ඒක නම් අත්‍යාවශ්‍යම දෙයක්.ඒ භූමියත් අපට ඉතාම වටින සම්පතක්.අමිල සභාපතිතුමාගෙ කාලේ අපි ඕකට හොඳ සැලැස්මක් ඉදිරිපත් කළා.තියෙන ගොඩනැගිලිවලට බාධාවක් නොවෙන විදියටත්,ජලය නොරැඳෙන විදියටත් දුර්ගන්ධයක් පිටතට නොඑන විදියටත් ඉදි කරන්නේ කොහොමද කියලා.විකල්ප මාර්ගයක් තියෙනව නම් තවත් හොඳයි.මොනම ඉදි කිරීමක් කරන්න වුණත් දැන් ඔය කුඩා භූමි ප්‍රමාණය විතරයි අපට තියෙන්නේ.ඒ නිසා ඒ භූමිය ඉතාම වටිනවා.ඒ වගේම උඩවලව සමගි ක්‍රීඩා පිටියට අයත් භූමියත් ඉතා කුඩායි.හොඳම සැලැස්මකට ඕන මේ භූමිවල ඉදි කිරීම් කරන්න ඕන.

- **ඒ අනුව, උඩවලව, මලබොටුආර ක්‍රීඩා පිටියෙහි පිහිටා ඇති දිරාපත් වූ ප්‍රජා ශාලා ගොඩනැගිල්ල නැවත ඉදිකර ගැනීම සඳහා ඇඹි/ප්‍රාලේ/සව/සං/223 ප්‍රජා මූලික වැඩිහිටි සංවිධානය වෙත අවසර ලබාදීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව, ඒ සඳහා විරෝධතාවයක් නොමැති බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**07.කාරක සභා වාර්තා සලකා බැලීම.**

- **2022.02.28 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා.</u>

2022.02.28 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව අනුමැතිය සඳහා ඉදිරිපත් කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා</u>

2022.02.28 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව අනුමැතිය ලබාදීම සුදුසු බවට මා යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා</u>

ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව 2022.02.28 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාවේ සංශෝධන නොතිබූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**08.මාසික ආදායම් වියදම් වාර්තා සලකා බැලීම.**

I. **2022 පෙබරවාරි මස ලැබීම් සාරාංශය.**
II. **2022 පෙබරවාරි මස ගෙවීම් සාරාංශය.**
III. **2022.02.28 දිනට අදායම් එකතු කිරීමේ ප්‍රගති වාර්තා.**
IV. **2022 පෙබරවාරි මස ලක්ෂ 10ට වැඩි විදයම්.**

<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා.</u>

2022 පෙබරවාරි මාසයට අදාළ ඉහත සඳහන් වාර්තා සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කර සිටිනවා.

<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා.</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

- **ඒ අනුව, 2022 පෙබරවාරි මාසයට අදාළ ඉහත සඳහන් වාර්තා සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදුව,ඒ සඳහා විරෝධතාවයක් නොවූ හෙයින් ඒකමතිකව සභා සම්මත විය.**

**09.වෙනත් කරුණු**

**<u>ගරු උප සභාපති ජයවීර මාතරආරච්චි මහතා</u>**

ගරු සභාපතිතුමණි,මෙතෙක් කලක් ජනතාවගේ බදු මුදලින් තමයි අපි සංවර්ධන කටයුතු කරගෙන ගියේ.නමුත් මේ වන විට සභාවේ ආදායම ගිලිහී ගිහින් සංවර්ධන කටයුතු අඩාල වෙලා තියෙන්නේ.සභාවේ විතරක් නෙමෙයි සමස්ත රටේම ඒ තත්ත්වය උදාවෙලා තියෙන්නේ.ජනතා නියෝජිතයෝ හැටියට ගම් ඇතුළෙ පොඩි පොඩි සංවර්ධන කටයුතු අපි සිදු කළත් සභාවේ අඩුපාඩුකම් සපුරා ගන්නට අපට අවස්ථාවක් ලැබුණේ නැහැ.දැනට අපට එහෙම ආර්ථික හැකියාවකුත් නැහැ.ඒ නිසා මම පොඩි යෝජනාවක් කරනවා ගරු සභාපත්තුමණි,මේ මන්ත්‍රීවරු ළඟින් ඇසුරු කරන කැබිනට් ඇමතිවරු ඉන්නවා.එ.ුමන්ලා හරහා හරි මේ ගොඩනැගිල්ල ඉදි කරලා ඒ අවශ්‍යතා ටික සපුරා ගන්න තියෙනව නම් හොඳයි.ඇත්තටම නිලධාරීන් මෙහි වැඩ කටයුතු කරන්නේ හරිම අපහසුවෙන්.ඉඩ පහසුකම් ඉතා අඩුයි.අපි මේකෙන් යනකොට හරි මේ ගොඩනැගිග්ග ඉදි කරල යන්න පුළුවන් නම් හොඳයි.මේ සම්බන්ධව විශේෂ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා.</u>**

පළාත් පාලන ඇමතිතුමා ළඟට මම ගමන් තුන හතරක්ම ගිහින් ඇස්තමේන්තු භාර දුන්නා.නමුත් ප්‍රතිපාදන ලබා දුන්නේ නැහැ.ආණ්ඩුකාරතුමා මේ අවුරුද්දේ අනිවාර්යයෙන්ම ප්‍රතිපාදන ලබා දෙනවා කියලා පොරොන්දු වුණා.අපි බලමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා</u>**

ගරු සභාපතිතුමණි,උප සභාපතිතුමා හොඳ යෝජනාවක් කළේ.දැනගන්න කැමතියි,මේ දිනවල මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය මේ දිනවල ධාවන තත්ත්වයේ තියෙනවද කියලා.

**<u>ගරු සභාපති සුරන්ත ජයලත් මහතා.</u>**

එය ධාවන තත්ත්වයේ තියෙනවා.මේ දිනවල ඉන්ධන ප්‍රශ්නය නිසා බොහොම අපහසුවෙන් තමයි දුවන්නේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා</u>**

ගරු සභාපතිතුමණි,මම බැකෝ ලෝඩර් යන්ත්‍රය හෝ මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය යොදවලා උඩවලවෙ මාර්ගයක් සංවර්ධනය කරන්න යෝජනාවක් දැම්මා.ඒ පිළිබඳව පොඩ්ඩක් අවධානය යොමු කරලා ඒ කටයුත්තට එම යන්ත්‍රයක් යොදවන්න කියලා ඉල්ලනවා.ඒක කවුරු මැදිහත් වෙලා කළත් කමක් නැහැ.වැඩේ කෙරෙන්නයි ඕන.ඒ වගේම සභාපතිතුමාගෙ පැත්තතෙන් වචනයක් මතුවුණා,“සභාවෙ වාහනවලටත් තෙල් ගහන්නේ බොහොම අමාරුවෙන්” කියලා.හිහයි වගේම තමයි ගරු සභාපතිතුමණි,ඉන්ධන 85% කින් මිල ගිහිල්ලා තියෙන්නේ.ඒ විතරක් නෙමෙයි සිමෙන්ති 100% කටත් වැඩියෙන් මිල ගිහින් තියෙන්නේ.හාල් මිල වැඩියි.සීනි මිල වැඩියි.ඇමතිවරු හමුවෙලා සභා ගොඩනැගිල්ලේ ඉහල මහල ඉදි කරන්න ප්‍රතිපාදන ගන්නවා වගේම ජනතාව ඉන්නෙත් ලොකු පීඩනයකින්.ඒකත් කියන්න අමතක කරන්න එපා.අත්‍යාවශ්‍ය සියළුම දේවල මිල වැඩියි.මධ්‍යම රාත්‍රියේ බඩු මිල වැඩි කරනකොට මෙහේ කඩවල්වල තියෙන බඩු මිලත් වැඩිවෙලා.පාන්පිටි මිල රු:35.00කින් වැඩි වෙනකොට පාන් ගෙඩිය රු:30.00කින් වැඩි වෙලා.ඒව හොයන්න කවුරුවත් නැහැ.ඒකයි ප්‍රශ්නේ.ආණ්ඩුව ඇතුළේ තියෙන කළමණාකාරිත්වයේ තියෙන දුර්වලතා නිසා තමයි එහෙම වෙන්නේ.මේ ප්‍රශ්න අස්සේ කළු කඩ ජාවාරමකුත් හිස ඔසවලා.ජනාධිපතිතුමාටවත් මේව පාලනය කරන්න බැහැ.මහ බැංකුවේ බැඳුම්කර වංචාවට සම්බන්ධ අය දෙපාරකට නිදහස් කළා.මහා හොරකමක් එතනින් ඉවරයි.ඇත්තටම මිනිස්සු බොහොම අසරණ වෙලා අමාරුවෙන් තමයි ජීවත් වෙන්නේ.සල්ලි අච්චු ගහලා ඒක විසඳන්න බැහැ.දැන් සල්ලි තියෙනවා.බඩු නැහැ.දැන් හොරු දෙගොල්ලක් බිහිවෙලා.එක හොරෙක් සල්ලි නැති නිසා හොරකම් කරනවා.අනිත් හොරා බඩු නැති නිසා හොරකම් කරනවා.ඒ නිසා සල්ලි අච්චු ගහන එක ප්‍රායෝගික විසඳුමක් නෙමෙයි.මේ ප්‍රශ්නවලට ඕන ප්‍රායෝගික විසඳුම්.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ කැළුම් වික්‍රමසිංහ මහතා</u>**

ගරු සභාපතිතුමණි,උපුල් මන්ත්‍රීතුමා වලව හන්දියෙන් ඇතුළට තියෙන මාර්ගය ගැන කතා කළා.වැඩ ලක්ෂයේ ව්‍යාපෘතියෙන් ඒ මාර්ගය හදන්න ඇස්තමේන්තු සකස් කළා.අද හෙටම ඒකෙ වැඩ පටන් ගන්නවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.ඥාණතිලක මහතා</u>**

ගරු සභාපතිතුමා ඇතුළු සියළුම පක්ෂ විපක්ෂ මහජන නියෝජිත මහත්ම මහත්මීන්ගෙන් සහ ලේකම්තුමා ඇතුළු නිලධාරී සියළු දෙනාගෙන් අවසරයි.මම මේ අවස්ථාවේ නැගී සිටියේ විශේෂ කාරණාවක් මේ සභාවට දැනුම් දෙන්නයි.වසර 04ක් තිස්සේ මම මහජන නියෝජිතයෙක් වශයෙන් මෙම සභාව නියෝජනය

කළා.වර්තමානයේ රටේ පවතින දේශපාලන වාතාවරණය තුළ විශේෂයෙන් අපේ දේශපාලන ව්‍යාපාරය වටා දැවැන්ත ජනතාවක් එක්රොක් වෙමින් පවතිනවා.ඒ තුළ වඩාත් හොඳින් අපගේ පක්ෂයේ කාර්යභාරය කරගෙනයාම සඳහා තවත් ජවසම්පන්න තරුණ නායකත්වයකට අවස්ථාව ලබාදීම සඳහාත්,පුද්ගලිකව මාගේ අවශ්‍යතාවයනුත් සැලකිල්ලට අරගෙන මම තීරණය කළා, ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධූරයෙන් ඉල්ලා අස්වීමට.ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සියළුම ලියකියවිලි අදාල ස්ථානවලට මේ වන විටත් මම යොමු කරල තියෙන්නේ.මගේ අවස්ථාව මම මගේ පක්ෂයේ තවත් සහෝදරයෙකුට ලබාදීල තියෙන්නේ.ඔවුන් තව තවත් ක්‍රියාකාරී වෙමින් නව අත්දැකීම් ලබා ගනිමින් මේ ආයතනවල කටයුතු කරන්නට ඉගෙන ගන්නවා.එයයි මේ රටේ ඉදිරියට අවශ්‍ය වන්නේ.මෙම කාල පරිච්ඡේදය තුළ මා සමග කටයුතු කළ ගරු සභාපතිතුමා,උප සභාපතිතුමා,සියළුම පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුට මෙන්ම එදා සිට අද දක්වා මා සමග සභාවේ කටයුතු කළ ලේකම්වරු ඇතුළු සියළුම නිලධාරී මණ්ඩලයට හා අනෙකුත් සේවක මණ්ඩලයට මාගේ ප්‍රණාමය සහ කෘතඥතාවය මේ අවස්ථාවේ පළ කරනවා, මා සමග සහයෝගයෙන් කටයුතු කිරීම සම්බන්ධව.එම කාල පරිච්ඡේදය තුළ මා අතින් යම්කිසි අඩුපාඩුවක් ,හිත් රිදවීමක් සිදු වුණා නම් ඒ අපගේ පෞද්ගලික කාරණා හේතුවෙන් නෙමෙයි දේශපාලන වශයෙන් ඇති වූ සංවාද, විවාද හා ගැටුම් හේතුවෙනුයි.ඒ කිසිම කාරණාවක් අපි මේ සභාවෙන් එළියට ගෙන ගියේ නැහැ.කෙසේ වෙතත් මම ඔබ සියළු දෙනාටම සුභ පතනවා ඉදිරි කටයුතු සාර්ථක වෙන්න කියලා.සියළු දෙනාටම බොහොම ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා</u>

ගරු සභාපතිතුමණි,ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණා සම්බන්ධයෙන් අදහස් කීපයක් ප්‍රකාශ කිරීමට මම කැමතියි.එතුමා සඳහන් කරපු කරුණු සියල්ලම අපි මේ රටේ පුරවැසියෝ විදියට අත් විඳලා තියෙනවා.ඒකට හේතුව තමයි මේ වන විට රට මුහුණ පාල තියෙන දරුණු ආර්ථික අර්බුදය.මේක කවුරුවත් පෞද්ගලිකව ඇති කරපු අර්බුදයක් නෙමෙයි.ගෝලීය වශයෙන් දරුණු වසංගත තත්ත්වයකට අපි මැදිවෙලා ඉන්නවා.මේක අපේ රටේ පමණක් ඇති වූ තත්ත්වයක් නෙමෙයි.මේකට අප සියළු දෙනා එක්ව මුහුණ දිය යුතුයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා</u>

මේ වෙනකොට ලෝකෙ කඩා වැටුණු එක රටක් කියන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා</u>

ඇමරිකාව මේ වන විට ආර්ථික අවපාතයකට මුහුණ දෙමින් ඉන්නේ.අසල්වැසි ඉන්දියාවත් එහෙමයි.

සභාවේ සෝෂා....................

ඒ වගේම මෙම තත්ත්වය රටේ මේ අවුරුදු දෙක හමාර තුළ ඇති වූ තත්ත්වයක් නෙමෙයි.මේ ත්ත්වය ඇති වුණේ මීට කලින් රට පාලනය කරපු වැරදි පක්ෂ ගත්ත වැරදි තීරණ නිසයි.අපි පරිභෝජනය කරන ඩොලර් ප්‍රමාණයට රටට ඩොලර් එන්නේ නැහැ.ජනතාවගේ ආරක්ෂාව සඳහා රට අවුරුදු දෙකක්ම වහල තියන්න වුණා.සල්ලි අච්චු ගහලා හරි පවතින තත්ත්වය හමුවේ ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවන්න මේ ආණ්ඩුව කටයුතු කළා.යම්කිසි කෙනෙක් හිතනව නම් මේ ආණ්ඩුව උවමනාවෙන්ම ජනතාව අපහසුතාවයට පත් කරනවා කියලා,ඒක ලොකු වැරැද්දක්.ප්‍රජාතන්ත්‍රවාදී ජනතා නායකයෙක් කවදාවත් හෙම කරන්නේ නැහැ.

සභාවේ සෝෂා....................

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා</u>

රට මේ පත්වෙලා ඉන්න තත්ත්වයට වග කියන්න ඕන ජනතා විමුක්ති පෙරමුණ.

සභාවේ සෝෂා....................

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා</u>

ඇයි නැත්තේ.ඔබතුමන්ලා 2001 චන්ද්‍රිකා බණ්ඩාරනායක ජනාධිපතිතුමියට උදව් කළා.2005 දි මහින්ද රාජපක්ෂ මැතිතුමා එක්ක එකතු වුණා.එහිදී සෝමවංශ සහෝදරයා කියන දේවත් අහන්නේ නැතුව ඇමති

ධූරවලින් ඉවත්වෙලා ගියා.2010දි ෆොන්සේකා මත්තයා ගෙනල්ලා ආණ්ඩුවක් පිහිටුවන්න හැදුවා.2015 දී මෛත්‍රීපාල සිරිසේන මැත්තුමා ජනාධිපති කෙරෙව්වා.එතකොට මේ සියළු ආණ්ඩුවලට වග කියන්න ඕන ජනතා විමුක්ති පෙරමුණ නෙමෙයිද?මෙයාලට තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව භාර දුන්නා.හරියට කළා නම් කෝ තාම තියෙන්න ඕනනේ.

සභාවේ සෝෂා.....................

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.උපුල් කිත්සිරි මහතා</u>**

විමල් වීරවංශ මහත්තයා,ගම්මන්පිල මහත්තයා,වාසුදේව මහත්තයා කියන්නේ බොරුද?

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් වික්‍රමසූරිය මහතා</u>**

මේ ගොල්ලො හිතාගෙන ඇති ආණ්ඩු විරෝධී රැල්ලක් ඇති කළාම මේ ගොල්ලොන්ගෙ ඔඩොක්කුවට වැටෙයි කියලා.එහෙම වෙන්නේ නැහැ.තව බලවේග එනවා.මෙතුමන්ලා එදත් හිටියේ අධි මානසිකත්වයෙන්.අදත් එහෙමයි.ගොඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා නැත්නම් ඔබතුමත් නැහැ.මමත් නැහැ.එතුමා තමයි වැක්ලින් ටික බූස්ටර් එන්නත ගෙනත් ගැහුවේ.රටේ මේ ඇතිවෙලා තියෙන තත්ත්වයට අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහත්තයවත්,ගරු අගමැති මහින්ද රාජපක්ෂ මහත්තයවත් තනියම වග කිව යුතු නැහැ.මීට පෙර රට පාලනය කළ සියළුම දේශපාලන පක්ෂ,ආණ්ඩු වග කිව යුතුයි.විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණ වග කිව යුතුයි.එවුන් තමයි මූලිකවම මේ අර්බුද රාශියම නිර්මාණය කළේ.ඒක මම ප්‍රසිද්ධියේම කියනවා.බොහොම ස්තූතියි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බෙසිල් නුවන් කුමාර මහතා</u>**

ගරු සභාපතිතුමණි,ජනතා විමුක්ති පෙරමුණේ අපේ ගරු මන්ත්‍රී ඥාණතිලක මැතිතුමා වසර 04ක් තිස්සේ අප සමග එකට වැඩ කළා.මේ තරම් ඉක්මනින් එතුමා මන්ත්‍රී ධූරයෙන් විශ්‍රාම ගනියි කියලා මම හීනෙකින්වත් හිතුවේ නැහැ.රටේ පොදු ප්‍රශ්ණ වෙනුවෙන්,මහජනතාව වෙනුවෙන් එතුමන්ලා අපි සමග වාද විවාද කළාට කවදාවත් මෙතනින් එහාට ඒව අරගෙන ගියේ නැහැ.එතුමගේ ඉල්ලා අස්වීම සමස්ත ප්‍රාදේශීය සභාවටම පාඩුවක්.අපි හැමෝම ජනතාව වෙනුවෙන් සේවය කරන්න ආපු ජනතා සේවකයෝ.ඔබතුමා ඇත්තටම හොඳ ජනතා නායකයෙක්.ගෞරවනීය ලෙස ඔබතුමා එම තනතුරේ සේවය කළා.මම එතුමට මගේ ආචාරය පුද කරනවා.ඒ වගේම එතුමට දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජිත් ප්‍රේමලාල් මහතා</u>**

ගරු සභාපතිතුමණි,ජනතා විමුක්ති පෙරමුණේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.ඥාණතිලක මහතා වසර 04ක් තිස්සේ සහෝදර මන්ත්‍රීවරයෙක් විදියට අප සමග ඉතා සහයෝගයෙන් කටයුතු කළා.හොඳ නායකයෙක් වශයෙන් ජනතා ගැටලුවලට මැදිහත් වුණා.ඉතා හොඳ ජනතා සේවකයෙක් විදියට මම එතුමව දකිනවා.මෙම තීරණය එතුමගේ පක්ෂය විසින් ගත්ත තීරණයක් වෙන්න ඇති.කෙසේ වෙතත් මම එතුමාට සුභ පතනවා.එතුමගේ විශ්‍රාම දිවිය සැපවත් වේවා කියලා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිංහ මහතා</u>**

ගරු සභාපතිතුමණි,අපේ ඥාණතිලක මන්ත්‍රීතුමා මම මුලින්ම හඳුන ගත්තේ මන්ත්‍රීවරයෙක් විදියට නෙමෙයි හිතවතෙක් විදියට.ඇත්තටම එදා සිටම එතුමා බොහොම ඥාණාන්විත විදියට තමයි කටයුතු කළේ.එතුමා සභාවකට අවශ්‍යම පුද්ගලයෙක්.කෙසේ වෙතත් එතුමා තවත් සහෝදරයෙකුට අවස්ථාව ලබාදීල අද දින සිට මන්ත්‍රී ධූරයෙන් ඉවත් වෙනවා.මම එතුමාට සුභ පතනවා.ඒ එක්කම අද මේ සභාවේ ගොඩක් වාද විවාද සිදු වුණා.ආණ්ඩුවේ අසමත්භාවය කිව්වා.ජනාධිපතිතුමාගේ අසමත්භාවය කිව්වා.ඉන්ධන අර්බුදය ගැනත් කිව්වා.මම නිතරම නගරයට එන පුද්ගලයෙක්. ඇඹිලිපිටිය නගරයේ ඉන්ධන පිරවුම්හල් 04ක් තියෙනවා.මම ඊයේ දිනේ ඉන්ධන පිරවුම්හලක සේවය කරන පුද්ගලයෙක් සමග කතාබහ කළා.වෙනදට සාමාන්‍යයෙන් ඩීසල් බවුසරයක් ගැහුවම ඉවර වෙන්න දවස් 07ක් යනවා කිව්වා.දැන් ඩීසල් බවුසරයක් ගැහුවම පැය දෙකෙන් ඉවරයිලු.දැන් ඇඹිලිපිටිය නගරයේ සෑම ඉන්ධන පිරවුම්හලකටම දිනපතා ඩීසල් බවුසරයක්,පෙට්‍රල් බවුසරයක් එනවා.අනේ මම දන්නෙ නැහැ මේක ආණ්ඩුවේ වරදක්ද?නැත්නම් එකපාරටම වාහනවල තෙල් පිච්චෙනවා

වැඩි වුණාද කියලා.පැය දෙකෙන් ඩීසල් බවුසරය ඉවරයි.මේකට හේතුව මිනිස්සු පෞද්ගලිකව ස්ටොක් කරගන්නවා.හැම වාහනයකටම ටැංකියට එකයි,බැරල් එකට එකයි.මගේ ගේ ඉස්සරහ ගෙදර තියෙනවා ඩීසල් වීල් එකක්.ඒ පුද්ගලයා මේ වෙනකොට තිස් පහේ ඩීසල් බූලි 08ක් ගෙනල්ලා තියෙනවා.වීල් එක අවුරුද්දක් දුවන්න පුළුවන්.ඒ වගේ වෙන කොට ඉන්ධන හිඟයක් ඇතිවෙන එක සාධාරණයි.ඉන්ධන තියෙනවා.අනවශ්‍ය ගොඩ ගසා ගැනීම් නිසා තමයි හිඟවෙලා තියෙන්නේ.යම් යම් ගැටළුකාරී තත්ත්ව තියෙනවා.මම නෑ කියන්නේ නැහැ.ජනතා විමුක්ති පෙරමුණට වුණත් මේක දවසින් දෙකෙන් ගොඩ දාන්න පුළුවන් කියලා මම හිතන්නේ නැහැ.මම අහගෙන ජනතා විමුක්ති පෙරමුණේ කොළඹ දිස්ත්‍රික්කයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්ෂ්මන් නිපුනආරච්චි මහත්තයා කියනවා මේක ගොඩ දාන්න අපට වසර තුනක්වත් යයි කියලා.ජනතාවට කරුණු පැහැදිලි කිරීම තමයි විපක්ෂයේ කාර්යභාරය.පිළිගන්න එක නැති එක ජනතාවගේ වැඩක්.ඔබතුමන්ලා කරන්නේ ඒ විපක්ෂයේ කාර්යභාරය.ඒ නිසා ඔබතුමාලගෙ ගමන ඔබතුමාල යන්න.අපේ ගමන අපි යනවා.විශේෂයෙන් මම නැගී සිටියේ අපේ ඥාණතිලක සහෝදර මන්ත්‍රීතුමාට සුභ පතන්නයි.නැවත වතාවක් මම එතුමට සුභ පතනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සීතා පද්මිණී මහත්මිය**</u>

ගරු සභාපතිතුමණි මම නැගී සිටියේ වසර 04ක් පුරා අප සමග සහයෝගයෙන් කටයුතු කරපු අලේ ඥාණතිලක මන්ත්‍රීතුමා ගැන වචන ස්වල්පයක් කතා කරන්නයි.එහෙම කතා නොකළොත් ඒක ලොකු අඩුපාඩුවක්.මම එතුමා දීර්ඝ කාලයක් තිස්සේ හඳුනනවා.හැදියාව,ලැදියාව,නිහතමානීකම එතුමා ළඟ පිරිලා තිබුණා.එතුමා ගුණ යහපත්කම අතින් ඉතා ඉහලයි.එතුමා මන්ත්‍රීවරයෙක් විදියට මේ සභාවෙ එතුමගෙ හැසිරීම මම ඉතා අගේ කරනවා.මම එතුමට දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරනවා.එතුමගෙ සියළුම කටයුතු සාර්ථක වෙන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා.

<u>**ගරු සභාපති සුරන්ත ජයලත් මහතා.**</u>

විශේෂයෙන්ම මම සඳහන් කළ යුතුයි,ජනාධිපතිතුමා ගැනත්,ආණ්ඩුව ගැනත් බොහොම ලොකු විවේචන එල්ල වුණා.ජනතාවත් ඒ මතයේ ඉන්නවා කියලා මම දන්නවා.මේ අර්බුදය නිර්මාණය වෙන්නේ කාහොමද කියලා පක්ෂ විපක්ෂ සියළු දෙනාම දන්නවා.හැබැයි එතුමන්ලා විපක්ෂයේ කාර්යභාරය කරනවා.අපිත් විපක්ෂයේ ඉද්දි එහෙම තමයි.ජනතාව ලොකු බලාපොරොත්තුවකින් තමයි ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට රට භාර දෙන්නේ.එතුමා බොහොම හොඳ තීන්දු තීරණ ගත්තා.ජනතාව ඒව අනුමත කළා.ඒ වගේ අවස්ථාවක තමයි කොරෝනා වෛරස් තත්ත්වය රටට පහර දෙන්නේ.ඒක කවුරුවත් කතා කරලා ගෙන්න ගත්ත එකක් නෙමෙයි.ඒක ඉතා දරුණු ගෝලීය වසංගත තත්ත්වයක්.යුද්ධෙ කාලෙ වගේම නැවතත් ජනතාව මැරි මැරි වැටෙන්න ගත්තා.ඒ අවස්ථාවේ ආණ්ඩුව හිතුවේ කොරෝනා වසංගතයෙන් ජනතාව බේරගන්න විදියක් ගැන විතරයි.ජනතාවගේ ආරක්ෂාව ගැන සලකලා අවුරුදු එක හමාරක් රට වහල තියන්න සිදුවුණා.සංචාරකයෝ රටට ගෙන්න ගන්න එක සම්පූර්ණයෙන්ම නතර කළා. මේ රටට ඩොලර් එන ප්‍රධානම ක්‍රමය තමයි සංචාරක කර්මාන්තය.සංචාරක කර්මාන්තය සම්පූර්ණයෙන්ම නතර වුණා.තියෙන ඩොලර් සංචිතවලින් කොරෝනා එන්නත් වගේම අත්‍යාවශ්‍ය භාණ්ඩ මිලදී ගන්න සිදුවුණා.හැබැයි හිස්වන ඩොලර් සංචිත පුරවන්න රටට ඩොලර් ආවේ නැහැ.මේ තත්ත්වයෙන් එක පාරටම ගොඩ එන්න බැහැ.මේ රට මේ තැනට ඇද වැටීම සම්බන්ධයෙන් පාලකයින් ඇතුළුව රටේ සමස්ත ජනතාවම වග කිව යුතුයි.එක පැත්තකට විතරක් ඇඟිල්ල දික් කරලා පැත්තකට වෙන්න බැහැ.රටේ සෑම පුරවැසියෙකුටම තියෙනවා යුතුකම් හා වගකීම් කොටසක්.මොන පුරවැසියද ඒ යුතුකම් හා වගකීම් අකුරමට ඉටු කළේ.එහෙම කළා නම් ඒ ඉතා සුළු පිරිසක් විතරයි.මේ රට ගොඩගන්න තීන්දුවේ සමස්ත පුරවැසියාම සිටිය යුතුයි.එකිනෙකාට චෝදනා කර ගැනීම ඉතා පහසුයි.මිනිස්සු අසාධාරණයි කියලා මම කියන්නේ නැහැ.යම් යම් ගැටළු තියෙනවා.නමුත් සමස්තයක් විදියට අතිගරු ජනාධිපතිතුමාත්,ගරු අගමැතිතුමාත්,ජනතා ගැටළු විසඳන්න උපරිමයෙන් කැප වෙනවා.එතුමන්ලා මේ රටට අසීමිත විදියට ආදරේ කරන දේශපාලන නායකයෝ.මම ඒ ගැන ඊට වඩා පැහැදිලි කරන්න යන්නේ නැහැ.ඒ වගේම මම කියන්න ඕන අපේ ඥාණතිලක මන්ත්‍රීතුමා ඉතා හොඳ දේශපාලනඥයෙක්.නිරහංකාර හරි දේ කතා කරන නායකයෙක්.එතුමා ධූරයේ සිටිය යුතු මන්ත්‍රීවරයෙක්.එතුමට අපි සුභ පතනවා ඉදිරි දේශපාලන ජීවිතය සාර්ථක වේවා කියලා.

- **ගරු සභාපති තුමාගේ ස්තූති කථාව.**

අද දින මහ සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහාය ලබා දුන් සියලුම ගරු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයටත් මාගේ ගෞරව පූර්වක ස්තූතිය පුදකර සිටිනවා.

2022.03.15 වන දින පැවති මහ සභාව මධ්‍යාහ්න. 12.00ට පමණ නිමාවට පත් විය.

සුරන්ත වීරසිංහ,
සභාපති,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව,
තුංකම.